ලංකාදීප 2019.07.09 පිටුව 1,2

# 2018දී රැකියා වියුක්තිය ඉහළ ගිහින්

බද්දේගම - ඕ. කමලනාථ

2018 වසරේ රැකියා වියුක්ති අනුපාතය සියයට 4.4 දක්වා ඉහළ ගොස් ඇතැයි ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත පෙන්වා දෙයි. 2017 රැකියා වියුක්ති අනුපාතය සියයට 4.2ක් විය.

02 පිටුවට

## 2018දී...

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත පෙන්වා දෙන ආකාරයට 2017 වසරේ රැකියා වියුක්තිය 358,507ක් වූ අතර 2018 වසරේදී එය 372,591 දක්වා ඉහළ ගොස් තිබේ. රැකියා වියුක්ති අනුපාතය සියයට 4.4ක් වන අතර ඉන් සියයට 3ක ප්‍රතිශතයක් පුරුෂ වන අතර සියයට 7.1 ප්‍රතිශතයක් ස්ත්‍රීන්ය.